

# මුර දේවතාවුන් කුපිත කිරීම (වීම)

අචේතනික පූජනීය වස්තු දෙකක් තිබෙනතාක් කල් ශ්‍රී ලංකාවට අනතුරක් නොවන බවට විශ්වාසයක් අපේ බොහෝ දෙනා තුළ ඇත . විශ්වාසය කොහොම වුණත් කතාවට ඔහොම කියනවා ය. ඒ ඇරුණු කොට සචේතනික බලවේගයක් ද මේ රැකවරණය පිණිස පෙළ ගැසී සිටින්නේ ය. ජාතියේ මුර දේවතාවුන් වශයෙන් හඳුන්වනු ලබන ඒ පිරිස අපේ මහා සංඝරත්නයයි. ඔහොම කිව්වාට ඔය තුන් ගොල්ලන්ම දිවයිනේ පවතිද්දී සුද්දෝ මුළු රටම අල්ලා ගත්හ. අල්ලාගෙන සියවස් එකහමාරක් විතර යහතින් ආණ්ඩු මේච්චල් කළෝ ය. ඔවුන් රට අත්ඇරලා ගියේත් බයකට හෝ අනුන්ගේ කීමට ද නොවේ. සිය කැමැත්තෙන්ම ය.

***<u>ගතවූ ජනාධිපතිවරණයට පෙරාතුවත් පහුවත් මහනායක හාමුදුරුවන් බැහැ දකින්නට ගිය අපේක්ෂකයන් හා ආධාරකරුවන් නිමක් නැත. එකම පැත්තෙන් පිට පිට නායකයෝ ගියෝ ය. ගිහින් පැමිණිලි කළෝ ය. ආශිර්වාද ලබා ගත්හ. තමන්ට හිතකර ප්‍රකාශ පවා මහනාහිමිගෙන් ලබා ගත්හ. මොනවා නොකීවත් පහුවදා උදේට මහනා හිමියන් සමග තමන් සිටින ඡායාරූපයක් පත්තරේ පළ කරවා ගැනීම මොන තරම් දෙයක් ද?</u>***

මා කියන්නට හදන්නේ ඔය මුර දේවතාවුන්ගේත් සුපිරි හරිය ගැන ය. මහානායක හාමුදුරුවරුන් ගැන ය. මේ ගැන කියන එක බෙල්ල ගහලා යන වැඩක් බව මම දනිමි. 1960 මාර්තුවේ ඩබ් එස් කරුණාරත්න ගේ අතේ තිබිච්ච මහනුවර ආසනය නූලෙන් ගහලා ගියේ ඔහුගේ නායකයා එනම් පිලිප් ගුණවර්ධන මල්වත්තට ඇඟිල්ල දික්කරපු හින්දා ය. මල්වත්තට අයිති නින්දගම් අරගෙන මුං වගාවක් දානවා කිව්ව නිසා ය.

මගේ ගැලවිල්ලට තියෙන්නේ මුං වගාකරන්නට තියා නිකමටවත් ඒ පැත්තේ යාමට අදහසක් නොතිබීම ය. මල්වත්ත අස්ගිරිය දෙක නොවෙයි අනෙක් මහානායකහිමිවරුන් ගැනවත් කිසිම වරදක් කීම බෞද්ධයන්ට මහා පාපයක් විදියට පේන දෙයකි. මා දන්නා තරමට සමස්ත සංඝ රත්නයට ලුණු ඇඹුල් ඇතිව දොස් කී එකම පුද්ගලයා ඩී ඒ එන් සේනාරත්න නමැති ලේඛකයා ය. දැනට වසර දොළහකට විතර උඩදී ලියූ -බුදුන් නොවදාළ ධර්ම" නම් ග්‍රන්ථයේ සේනාරත්න, සිංහල රජ බස කිරීමේ දී සටන් බිමට පිවිසි භික්ෂුන් වහන්සේලා කළ හානිය තදින්ම විවේචනය කර ඇත .

ඒ පොත ගැන පවා වැඩි දෙනෙක් කතා නොකළහ. කතෝලික පල්ලියට අයත් කෙනෙකු ලිව්වා නම් ඒක අර තහනම් ලැයිස්තුවට දමනවා සිකුරුය. බෞද්ධයන් අතර එහෙම දරුණු නීති නැත . කරන එකම දේ හෙළා දැකීමය. නොතකා හැරීම ය. එය සැදැහැවත් බෞද්ධයාගේ පිළිවෙතයි.

ශ්‍රී ලංකාවේ මහානායක හාමුදුරුවරුන් හය දෙනකු පමණ වැඩවාසය කළත් මුලටම ගැණෙන්නේ ගණනින් වැඩි සියම් නිකායට අයත් මල්වත්තේ සහ අස්ගිරියේ මහනායක හිමි දෙපළය. කෝට්ටේ තවත් මහනායක හිමි නමක් හිටියත් ඒ ගැන වැඩියෙන් කියැවෙන්නේද නැත . ලොකු ලොකු උදවිය හැම දේටම යන්නේ මල්වත්තටය. ඒ ගමන්ම අස්ගිරියටත් යනවා ය.

මේ ගමන කතරගම ගමනට සමාන කළොත් අපේ බෞද්ධ නායකයන් කුපිත වන්නටත් බැරි නැත. එහෙත් මට නම් පෙනෙන්නේ අරමුණ එකම බව ය. කතරගම යන්නේ යමක් බලාපොරොත්තුවෙන් ය. දිනුමක් පතාගෙන ය. පැරදුණත් ගිහිල්ලා දෙවියන්ට කන්නලව් කරනවා ය. දෙයියන්ගේ එක හොඳක් තියෙන්නේ මොනවා වෙලා ආවත් මොන මොන දේ කරගෙන තමන් ළඟට බඩගෑවත් ඒ එන කාට කාටත් පිහිට වෙන එකය.

දෙවියන් ගාවට අත වන වනා යන කෙනෙක් නැත. මහනාහිමියන් ගාවටත් හිස් අතින් යාමක් නැත. අරගෙන යන්නේද ඉස්තරම්ම පිරිකර ය. දෙවියන්ට පූජා කරන්නේද හොඳම පළතුරු ය. ඒ වාගේ නොවේ. මහනා හිමියන් වෙත යන ගමනට පිරිකර සකස් කරගැනීමේ බරපතළ කම මා දැනගත්තේ මහණවෙලා හිටපු මගේ පොඩි අය්යා උපසම්පදාවට මල්වත්තට යාමට සැරසෙද්දීය. අපේ ගෙදරින්ම ගියේ තාත්තා විතර ය. පවුලටම යාමට හය්යක් නැත. ඒ වුණාට හත් අට තැනකට පිරිකර අරන් යාමට ලොකු මුදලක් වැය වන බවය නායක හාමුදුරුවන් කීවේ. ඒකෙනුත් තාත්තා දුන්නේ සොච්චමක් පමණී. වැඩි හරිය නායක හාමුදුරුවෝ අතින් දැමුවෝ ය.

මහනා හිමියන් ගාවට ආශිර්වාද ලබන්නට නැත්නම් දුක්ගැනවිලි පැමිණිලි කරන්නට යන දේශපාලකයෝ අනන්තය. අබෞද්ධයෝ ද යති. ඒ අතරින් මුලටම එන්නේ වතිකානු නියෝජිත දොස්තර ජයලත් ජයවර්ධන ය. ඔහු නායක හාමුදුරුව පවා වන්දනාවේ අරන් ගිය නඬේ ගුරෙක්ද වන්නේ ය.

අපේ මව්බිමේ දේශපාලකයන්ට මොනවා නැති වුණත් සල්ලි වලින් නම් හිඟයක් නැත. ඒ නිසා පිරිනමන පිරිකර නොහොත් තෑගි බෝග ඉස්තරම් ඒවා වීමද අනිවාර්යය. කතරගම පූජා වට්ටියට උඩින් තබන නිල් කොළ වාගේ නැතහොත් මේ රටේ බෞද්ධයන් කරන විදියට කවරයක බහා මුදල් දෙනවාද කියන එක නොදනිමි.

එහෙම කියනකොට මට සල්ලි දීපු කතාවක් ද මතක් වෙනවා ය. දුන්නේත් හරියටම මල්වත්තේ නායක හාමුදුරුවන් අතටය. එවකට අගමැති තනතුර හෙබවූයේ රනිල් වික්‍රමසිංහ ය. ඒ දීපු විස්තරය පත්තරේ පළවුණෝ පින්තූරයක් එක්ක ය. දීපු චෙක් පතේ ගණන ලක්ෂ පහක් ද කෝටි පහක් ද යන්න මට නිච්චි නැත. ඉලක්කම නම් හරියටම පහ ය. පහුවදාම පළවූ ඡායාරූපය පසුව පළ කිරීම නැවැත්වූයේ කතාව පැතිරෙන නිසා විය යුතු ය.




කතාව මොකක්ද? කොටි තහනම ඉවත් කරන්නට ඔන්න මෙන්න කියලා ඔය සල්ලි පූජා කළේ මහනායක හාමුදුරුවන් නිහඬ කරවන්නට යයි ජනතාව කියන්නට ගත්තු නිසාය. එරික් සෝල්හයිම් ගේ කපුකමේ අනුහසින් එල්ටීටීඊයට අවි එකතු කරගෙන යුද බලය තහවුරු කරගැනීමට ඉඩ පහසුවක් ලැබෙන විදියට සැලසුම් කළ සටන් විරාමය සමග ඔවුන්ට ජාත්‍යන්තර පිළිගැනීමක් ද ලබා දීමේ අදහස සහිතවය තහනම ඉවත් කරන ලද්දේ. හිතුවා වාගේ මහනායක හාමුදුරුවෝ කිසිම දෙයක් නොකියා නිහඬ වූ සේක.

සමහරු සුඛෝපභෝගී රථ පවා මහානායක හාමුදුරුවන්ට පූජා කරන්නෝ ය. ඒ කිසි දෙයක් තෑගි වශයෙන් නොගත යුත්තේ කොහොම දුන්නත් පූජා භාණ්ඩ ගණයට වැටෙන නිසා ය. පූජා භාණ්ඩයක් යනු පින්කමක් මිසක් පගාවක් නොවන්නේම ය.

මෑතකදී ජනාධිපති තුමා පරිත්‍යාග කරන්නට හදපු බෙන්ස් රථයක්ද මහනායක හාමුදුරුවන් ප්‍රතික්ෂේප කළ බවක් වාර්තා විය. එය පුදුමයක් විය යුතු නොවේ. ඔය පූජා භාණ්ඩ පිරිකර හුදු අනුකම්පාවෙන් නොහොත් සත්ව කරුණාවෙන් බාර ගන්තාට උන් වහන්සේට මුදල් අතින් සහ වාහන අතින් හිඟයක් නැති නිසා ය.

ගතවූ ජනාධිපතිවරණයට පෙරාතුවත් පහුවත් මහනායක හාමුදුරුවන් බැහැ දකින්නට ගිය අපේක්ෂකයන් හා ආධාරකරුවන් නිමක් නැත. එකම පැත්තෙන් පිට පිට නායකයෝ ගියෝ ය. ගිහින් පැමිණිලි කළෝ ය. ආශිර්වාද ලබා ගත්හ. තමන්ට හිතකර ප්‍රකාශ පවා මහනාහිමිගෙන් ලබා ගත්හ. මොනවා නොකීවත් පහුවදා උදේට මහනා හිමියන් සමග තමන් සිටින ඡායාරූපයක් පත්තරේ පළ කරවා ගැනීම මොන තරම් දෙයක් ද?

ආගම ධර්මය ගැන නිවන් යන හැටි නැත්නම් ගමනට සැරසෙන හැටි කියා දෙන්නට මහා නායක හාමුදුරුවන් තරම් අවබෝධයක් ඇති වෙන කිසිවකු නොසිටින්නටත් පුළුවන. ඒ හැරුණුකොට ඔය කොයි විදියේ පුද්ගලයන් ඇවිත් වැඳ වැටී උපදෙස් ඉල්ලුවත් - පැමිණිළි කළත් - මහා නායක හාමුදුරුවන් දේශපාලනය ගැන හෝ නීතිය ගැන දන්නේ ඉතා සුළුවෙන් බව පිළිගත යුතු ය. කොටින්ම ඒ කිසිම විෂයක් පිළිබඳ විශේෂඥතාවක් මහනායක පදවිය නිසා ලැබෙන්නේ නැත.

තමන් බැහැදකින්නට එන අපේක්ෂකයන්ට පක්ෂ භේදයකින් තොරව ආශිර්වාද කිරීම එකකි. ඒ අයට සහතික දීම වෙනත් දෙයකි. මහනා හිමියන් බැහැදුටු සරත් ෆොන්සේකා ඉන් පසුව කී දෙයක් මතක් වෙයි.

"මට මහනායක හාමුදුරුවන්ගේ ආශිර්වාද ලැබුණා.. ඒ ඇති.."

ඔය කියන ආශිර්වාදය තමාටත් සතුරාටත් දෙන එකක් බව ෆොන්සේකා නොදත්තේ ද? එසේත් නැත්නම් එය ඔහුට පක්ෂපාතීව කරන ලද විශේෂ ආශිර්වාදයක් වී ද?

මට මේ ප්‍රශ්නය හිතෙන්නේ ආර් සම්බන්දන් සමග එකඟතාවක් ඇතිකර ගෙන තමා වෙත ආ සරත් ෆොන්සේකා ඉදිරියේ මල්වතු මහනා හිමියන් කළ ප්‍රකාශයයි. එය පත්තරවල පවා පළවිය. උන්වහන්සේ කියා වදාළේ සරත් ෆොන්සේකා රට නොබෙදන බව තමාට විශ්වාසය කියා ය.

ඒක නම් තරගකරුවකුට දෙන සහතිකයකි. ආර් සම්බන්දන් ඇතුළු අනෙකුත් දෙමළ නායකයන් සරත් ෆොන්සේකාට උදවු කරන්නේ නිස්සරණාධ්‍යාශයෙන් නොවන බව මුළු රටම දැන සිටියේ ය. දෙපක්ෂයම රටට වසන් කළත් එතැන හොර ගිවිසුමක් ඇති බව ජනතාව සැක කළ හ. එහෙව් වෙලාවක අර වාගේ සහතික කොට යමක් කියන්නට මහනායක හාමුදුරුවන්ට පරසිත් දන්නා නුවණ තිබුණෝ ද?

එතැන නම් උන්වහන්සේ පක්ෂග්‍රාහි වූ බවය මට නම් පෙනෙන්නේ. ඔහොම වෙලාවට වජිර පැල්පිට හිටියා නම් තවත් එකක් කියන එක නම් සිකුරුයි. මහනායක හාමුදුරුවන් සරත් ෆොන්සේකාට සහතික දුන්නාට මහනකම ඉල්ලුවොත් නම් බැහැ කියනවා කියා කියනු නිසැක ය.

ගැමි ජනයා ෆොන්සේකා සම්බන්දන් හවුල පිටුපස රහස් ගිවිසුමක් ඇති බව අනුමාන කළේ මහනායක හාමුදුරුවන් සහතිකය දුන්නාටත් පසුවය. රජපක්ෂ දිනුවේ ඒ නිසා ය.

ඡන්දෙන් පස්සේ කරු ජයසූරිය අතට පත් වූ පරණ ඡන්ද පත්‍රිකා අරගෙන ඔහු දිව ගියේ මල්වත්තටය. මහනායක හාමුදුරුවන්ට පෙන්වන්නටය. උන් වහන්සේට ඡන්දයක් නම් තිබෙන්නට ඇත. මහනායක පදවිය තිබුණාට ඉන් එහා උන්වහන්සේ මොනවා දන්නවාටද? අර ඡන්ද පත්‍රිකා අරන් යා යුත්තේ මැතිවරණ පරිපාටිය ගැන දන්නා - මැතිවරණ නීතිය දන්නා කෙනකු ළඟට ය. මහනාහිමියන් ළඟට ගියේ ඇයි? නීතිමය ප්‍රශ්නයක් මතු කිරීමට නොවේ. ප්‍රකාශයක් අරගෙන ජනතාව කුලප්පු කිරීමටයි. මහනායක හාමුදුරුවරු ඒවාට අසුවෙති. ඒකට කියන්නේ අන් කිසිවක් නොව නොදන්නාකම කියා ය. මහනායක හාමුදුරුවන් වුණත් හැම දෙයක්ම නොදන්නා බව පිළිගත යුතු ය.

සරත් ෆොන්සේකා අත්අඩංගුවට ගත් පසු අස්ගිරියේ මහනා හිමියන් ද මල්වතු නාහිමියන් සමග ප්‍රකාශ නිකුත් කර තිබුණෝ ය. ඒකත් අර වගේම කවුරුන් හරි ගිහිල්ලා පැමිණිළි කළ නිසා ය. එතැන අරිට වඩා බරපතළ නීති ප්‍රශ්නයක් ඇති බව පැහැදිලි ය. ෆොන්සේකා අත්අඩංගුවට ගැනීමට අවශ්‍ය නීතිමය පසුබිමක් නැතොත් එයින් අවාසි වන්නේ එය කළවුන්ටය රජයටය. ඒ ගැන තීන්දුවක් දෙන්නේ අධිකරණයයි. මහනා හිමියන්ට අධිකරණය කරන වැඩ කරන්නට බලයක් හෝ තේරුමක් ද නැත. මේ තැන්වල වැජඹෙන මහා සංඝ රත්නය ඒ සුලු කරුණ පවා නොදැන කල්පනා නොකොට රට කළඹන විදියේ ප්‍රකාශ නිකුත් කිරීමෙන් ශාසනයට හෝ රටට වන සෙතක් ඇද්ද? එසේත් නැතහොත් ඔය ප්‍රකාශ නිකුත් කිරීම ලාභදායක ක්‍රියාවක් ද?

මේ ප්‍රශ්න සියල්ලම යට කරගෙන මතුවන - මතු කළ යුතු ප්‍රශ්නයක් ඇත. ජාතියේ මුර දේවතාවුන් වශයෙන් පෙනී සිටින මහා සංඝරත්නය රට රැක ගැනීමට ඉදිරිපත් වෙනවා නම් ජනාධිපතිවරණයට පෙර ඔවුන් කළ යුතුව තිබුණේ රට දෙකට බෙදන විදියට සේනාධිනායක සහ හිටපු සේනාධිපති යන දෙදෙනා අතර තරගයක් සිදුවීම වළක්වන එක ය. පෝලිමට වාගේ තමන් වෙත එන්නට තරම් ගරු සරු දක්වනවා නම් කියන දේට කන් දෙන්නටත් සූදානම් විය යුතු ය. එසේ කළා නම් අර අවාසනාවන්ත තරගය නොහොත් ඝට්ටනය මගහැරලන්නට තිබුණා නේද?

එහෙම නොකර සටන ඉවරවුණාට පසු නොතේරෙන දේවල් ගැන තීන්දු දෙන්නට යාම මුළු රටටම හානියක් බව මල්වතු - අස්ගිරි දෙතැන මහානා හිමිවරුන්ට කවුරුන් හෝ මතක් කර දිය යුතු ය.